සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

# Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

## ඉන්දියා ඉතිහාසය I

කාලය පැය එකයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම 5 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නාම සමඟ නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉරමත ලියන්න.**

01. 1. මගධ  2. කෝසල  3. වජ්ජි
4. වත්ස  5. අවන්ති  (.....)

02. 1. වින්ධ්‍යා  2. සත්පුර  3. ආරවල්ලි
4. බැරෝඩා  5. හිමාලය  (.....)

03. 1. ප්‍රාකෘත  2. බ්‍රාහ්මීය  3. මාගධි
4. ඇරමයික්  5. ග්‍රීක  (.....)

04. 1. නාලන්දා  2. අජන්තා  3. තක්ෂිලා
4. වලභි  5. වික්‍රමශීලා  (.....)

05. 1. ක්‍රිෂ්ණා  2. ගෝධාවරී  3. සින්දු
4. කාවේරි  5. තුංගභද්‍ර  (.....)

06. 1. භාරුකච්ච  2. සුප්පාරක  3. තාම්‍රලිප්ත
4. ලෝතාල්  5. මාතොට  (.....)

07. 1. මක්ඛලීගෝසාල  2. පූර්ණකස්සප  3. නිඝණ්ඨනාථපුත්ත
4. විශාකදත්ත  5. අජිත කේශකම්බල  (.....)

08. 1. ශ්‍රාවසති 2. සාංචි 3. කුසිනාරා
4. තක්ෂිලා 5. සාරානාත් (.....)

09. 1. නාසික් 2. කාර්ලේ 3. අජන්තා
4. නාලන්දා 5. එල්ලෝරා (.....)

10. 1. බ්‍රාහ්මණ 2. ආරණ්‍යක 3. මහාවංශය
4. උපනිෂද් 5. පුරාණ (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. 1. අශෝක - අලහබාද්
2. කණිෂ්ක - සාරානාත්
3. ඛාරවේල - හථිගුම්බා
4. II චන්ද්‍රගුප්ත - අයිහෝල්
5. රුද්‍රදාමන්ගේ - ජුනාගාඩ් (.....)

12. 1. වංශකථාවකි - රාජතරංගණිය
2. තාරකා ශාස්ත්‍ර කෘතියකි - බෘහද්සංහතිකා
3. වෛද්‍ය කෘතියකි - සුශ්‍රැත සංහිතා
4. නාට්‍ය කෘතියකි - පංච තන්ත්‍රය
5. ගද්‍ය කෘතියකි - කථා සරිත් සාගර (.....)

13. 1. මෙගස්තිනිස්ගේ - නැචුරාලිස් හිස්ටෝරියා
2. කෞටිල්‍ය - අර්ථ ශාස්ත්‍රය
3. වාල්මිකී - රාමායනය
4. කාලිදාස - මේඝදූතය
5. ශුද්‍රක - මෘච්ඡකටිකා (.....)

14. 1. භගවත් සූත්‍ර - ජෛන
2. පෙරියපුරාණම් - හින්දු
3. ශතපත බ්‍රාහ්මණ - වෛදික
4. රඝුවංශය - වෛෂ්ණව
5. කතාවත්ථු - බෞද්ධ (.....)

15. 1. අවන්ති - චණ්ඩපජ්ජෝත
2. මගධ - බිම්බිසාර
3. කෝසල - ප්‍රසේනජිත්
4. වත්ස - උදයන
5. කුරු - බ්‍රහ්මදත්ත (.....)

- **අංක 16 - 20 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුඅවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| X | Y |
|---|---|
| 1. රුම්මින්දේයි ටැම් ලිපිය | A කාලවේල |
| 2. අලහබාද් ප්‍රශස්තිය | B රුද්‍රදාමන් |
| 3. ජුනාගාද් ලිපිය | C සමුද්‍රගුප්ත |
| 4. හතිගුම්බා ලිපිය | D I වන පුලකේෂීන් |
| 5. අයිහෝල් ලිපිය | E අශෝක |

1. EBCDA 2. EDBAC 3. ECBAD
4. EACBD 5. EBDAC (.....)

17.

| X | Y |
|---|---|
| 1. හිමාලයා | A කාන්තාරයක් |
| 2. රාජ්පුතානා | B ගංගාවකි |
| 3. සුප්පාරක | C කඳුවැටියකි |
| 4. සින්ධු | D කපොල්ලකි |
| 5. මක්‍රාන් | E නැව් තොටකි |

1. ACEBD 2. ABCDE 3. ACBED
4. ADEBC 5. AEDBC (.....)

18.

| X | Y |
|---|---|
| 1. වසුමිත්‍ර | A මේඝදූතය |
| 2. මෙගස්තීනිස් | B මුද්‍රාරක්ෂය |
| 3. කෞටිල්‍ය | C ඉන්ඩිකා |
| 4. විශාඛදත්ත | D අර්ථ ශාස්ත්‍රය |
| 5. කාලිදාස | E මහා විභාෂා ශාස්ත්‍ර |

1. EABCD 2. EABDC 3. EBDCA
4. EBCDA 5. ECDBA (.....)

19. X Y

| X | Y |
|---|---|
| 1. යුද්ධයට අධිපති | A අග්නි |
| 2. ගින්නට අධිපති | B ඉන්ද්‍ර |
| 3. අහසට අධිපති | C යම |
| 4. මරණයට අධිපති | D කුවේර |
| 5. ධනයට අධිපති | E වරුණ |

1. BAECD 2. BACED 3. BCAED
4. BADCE 5. BACDE (.....)

20. X Y

| X | Y |
|---|---|
| 1. මෙහෙන්ජොදාරෝ | A ධාන්‍යාගාරය |
| 2. හරප්පා | B මහා නාන තටාකය |
| 3. ලෝතාල් | C ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය |
| 4. සුක්තජෝන්දොර් | D ප්‍රධාන වරාය |
| 5. කලිබංගන් | E ප්‍රාදේශීය නගරයකි. |

1. BADCE 2. BACDE 3. BCADE
4. BDEAC 5. BEDAC (.....)

- **අංක 21 - 25 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉරිමත ලියන්න.**

21. ඍග්වේදය ගීතිකා කීයකින් සමන්විත වේද?
1. 3600 2. 1028 3. 3200
4. 2840 5. 1640 (.....)

22. හරප්පා ශිෂ්ඨාචාරයේ කැණීම්වලදී සොයා ගන්නා ලද නවතම කාර්මික ජනපදය කුමක්ද?
1. ලෝතාල් 2. රූපාර් 3. රබීගාර්හි
4. කලිබංගන් 5. සුක්තජෝන්දෝර් (.....)

23. 'ත්‍රි මූර්තිය' ලෙස හඳුන්වා ඇත්තේ මින් කවර කාණ්ඩයට අයත් දෙවිවරුන්ද?
1. විෂ්ණු, ඊශ්වර, බ්‍රහ්ම 2. බ්‍රහ්ම, ඉන්ද්‍ර, විෂ්ණු 3. ඊශ්වර, වරුණ, විෂ්ණු
4. බ්‍රහ්ම, යම, වරුණ 5. වරුණ, විෂ්ණ, ඉන්ද්‍ර (.....)

24. වර්ණශ්‍රම ධර්මවලට අනුව අන්තප්‍රාසන කර්මන් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
1. හිසකෙස් කැපීම 2. විවාහය 3. ඉඳුල් කට ගෑම
4. අවමංගල්‍යය 5. බ්‍රහ්මචාරී ජීවිතයේ ආරම්භය (.....)

25. සොළොස් මහා ජනපද අතරින් සණ හෙවත් සංඝ සමූහාණ්ඩු ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. වජ්ජි - මල්ල 2. මගධ, කෝසල 3. අංග, මගධ
4. වත්ස, අවන්ති 5. කාසි, කෝසල (.....)

- **අංක 26 - 30 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. පැරණි ඉන්දියානු ඉතිහාසය හැදෑරීමේදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ලැබෙන වටිනාකම
    1. වැදගත් ස්ථාන පිළිබඳ තොරතුරු දැන ගත හැකිවීම.
    2. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර අතරින් වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා දෙන වැදගත්ම මූලාශ්‍ර ප්‍රභේදය අභිලේඛන වේ.
    3. කාසි පිළිබඳ හැදෑරීම නාණක විද්‍යාව ලෙස හැඳින්වේ.
    4. පුරාවිද්‍යාත්මක නෂ්ඨාවශේෂ, ස්මාරක, කාසිවලින් ලැබෙන ප්‍රයෝජන ඉතා අල්ප වේ.
    5. වෙළඳාම, ආර්ථික, ජන ජීවිතය, ආක්‍රමණ, රාජධානි බිඳ වැටීම ආදී තොරතුරු රැසක් නාණක මූලාශ්‍රවලින් හෙළි කරගත හැකිවේ. (.....)

27. දේශීය සාහිත්‍ය මූලාශ්‍ර වල බෞද්ධ ග්‍රන්ථවල සඳහන් තොරතුරු
    1. අංගුත්තර නිකාය - බුදුන් දවස ඉන්දියාවේ දේශපාලන තත්වය විග්‍රහ කරයි.
    2. අග්ගඤ්ඤ සූත්‍රය - ඉන්දීය රාජ්‍ය පාලන තන්ත්‍රය හා ආර්ථික ක්‍රමයේ විකාශනය පිළිබඳ විස්තර කරයි.
    3. චක්කවත්තී සීහනාද සූත්‍රය - බෞද්ධ චක්‍රවර්තී සංකල්පය විශ්ලේෂණය කර තිබීම.
    4. මහා පරිනිබ්බාන සූත්‍රය - සමකාලීන දකුණු ඉන්දියානු ඉතිහාසය
    5. කූට දන්ත සූත්‍රය - ධාර්මික රාජ්‍යයක සැලැස්ම (.....)

28. වයඹ දිග දුර්ග මාර්ග
    1. මක්‍රාන් දුර්ගය - කිර්තාර් කඳු හා අරාබි අතර පිහිටා ඇත.
    2. ඛයිබර් දුර්ගය - කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා පිහිටා ඇත.
    3. බෝලාන් දුර්ගය - සුලෙයිමාන් කඳුවලට බටහිරින් පිහිටා ඇත.
    4. හේරත් දුර්ග මාර්ගය - ඇෆ්ඝන් කඳු ආශ්‍රිත ප්‍රදේශයේ පිහිටා ඇත.
    5. බැරෝඩා දුර්ගය - හිමාලයා කඳු ආශ්‍රිත ප්‍රදේශයේ පිහිටා ඇත. (.....)

29. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ නාගරිකරණ සැලසුම්
    1. මාර්ග තැනීම සඳහා පුළුස්සන ලද ගඩොල් යොදා ගෙන තිබීම.
    2. දියුණුම නාගරික සැලසුම් හමුවනුයේ රබීගාර්හිය.
    3. ප්‍රධාන නගර ආශ්‍රිතව මහල් නිවාස ඉදිකර ඇති බව.
    4. මොහොන්ජොදාරෝවේ මහා ධන්‍යාගාරය
    5. ලෝතාල් හා සුක්තජොන්දෝර් විදේශීය වෙළඳාමේදී ප්‍රධාන වරායන් ලෙස පැවතීම. (.....)

30. බෞද්ධ හා ජෛන ඉගැන්වීම් අතර ඇති සමානකම්
    1. වෛදික ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම.
    2. නිර්වාණය පිළිබඳ විශ්වාසය
    3. අන්තකිලමතානුයෝගය පුහුණු කිරීම
    4. කුලභේද සමාජය පිළිනොගැනීම.
    5. අවිහිංසාව පිළිගැනීම (.....)

- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා එක් ක් ප්‍රශ්නයට දක්වා ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

  **A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද**

  **B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද**

  **C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද**

  **A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද**

  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් අංක 5 ද වරහන තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. ඉන්දියාවේ ආර්ය ව්‍යාප්තිය

    A) ආරම්භයේදී ආර්‍යයයෝ සප්ත සින්දු ප්‍රදේශයේ පදිංචි වූහ.

    B) පසුව ඔවුහු ගංගා යමුනා නිම්නයට ව්‍යාප්ත වූහ.

    C) වෛදික යුගයේ මුල් අවධියේ ද වින්ධ්‍යාව තරණය කල ආර්යයෝ දකුණෙහි පදිංචි වූහ.

    D) ආර්‍යාවර්තයේ ආර්‍ය ව්‍යාප්තියෙහිලා දාසවරු වැදගත් භූමිකාවක් ඉටු කළහ. (.....)

32. ක්‍රි.පු. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති ගණ රාජ්‍යවල ප්‍රධාන ලක්ෂ්‍යය වුයේ,

    A) නායකයන් රජා යන විරුදාවලියෙන් හැඳින්වීම.

    B) රජවරුන් සියලු දෙනාටම රාජ්‍ය පාලනයට සහභාගීවීමට අවස්ථාව හිමිවිය.

    C) ඔවුන්ගේ රැස්වීම් පැවැත්වූ ස්ථාන සන්ථාගාර ශාලා නම් විය.

    D) ගණ රාජ්‍යවල විධායක බලය හිමිවුයේ මහාමන්ත්‍රීන්ටය. (.....)

33. කෞටිලාගේ අර්ථ ශාස්ත්‍රය

    A) සංස්කෘත භාෂාවෙන් ලියවී ඇත.

    B) මණ්ඩල 10 ක් යටතේ ශ්ලෝක 1200 කින් සමන්විතය.

    C) දේශපාලන න්‍යායික ග්‍රන්ථයක් ලෙස සැලකේ.

    D) පසුකාලීන රාජ්‍ය පාලකයෝ මේ කෘතිය ගුරු කොට ගෙන කටයුතු කරන ලදී. (.....)

34. හරප්පා නගරය

    A) නගරය ඉදි කරන ලද්දේ සැලසුමකට අනුවය.

    B) හරප්පා නගරයේ බලකොටු හා නගර ප්‍රදේශ කොටස් දෙකකි.

    C) විථි පළල් වු අතර මීටර් 4 සිට 10 දක්වා පළල් විය.

    D) නගරයෙහි කාර්යක්ෂමව ජලය බැස යන ක්‍රමයක් පැවතින. (.....)

35. මෞර්ය අධිරාජය බිඳ වැටීමට හේතු

A) අශෝක රජු තම බලය පාවිච්චි කරමින් ප්‍රදෝශීය පාලකයන් අවනත කර ගැනීම.

B) අධිරාජ්‍යයේ විශාලත්වය වැඩිවීම නිසා කාලීන රජවරුන්ට මනා ලෙස පාලනය කිරීමට අපහසු වීම.

C) සමුද්‍ර ගුප්ත රජුගේ දිග් විජය ප්‍රතිපත්ති මෞර්ය අධිරාජයේ ක්‍රියාත්මක වීම.

D) දක්ෂිණ පථය ආක්‍රමණය කිරීම. (.....)

- **පහත දැක්වෙන අංක 36-40 තෙක් වූ ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර විග්‍රහය දැයි තෝරා තිත් ඉරමත ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | නිවැරදිය |
| 2. නිවැරදිය | වැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. වින්ධ්‍යා කඳු වැටිය නැගෙනහිරින් බැරෝඩා දූර්ගය පිහිටා ඇත. | ආර්‍යයන් දකුණු ඉන්දියාවට යාමේදී වැදගත් වූ දූර්ගයකි. (.....) |
| 37. ඉන්දියානුවන්ගේ පැරණිම ආගමික සාහිත්‍ය ඍග් වේදයයි. | මෙම කෘතිය ඍෂිවරයන් කීපදෙනෙකු විසින් සංස්කෘතික භාෂාවෙන් ලියන ලද අතර දේශපාලන හා සමාජ තොරතුරු ඇතුළත් වේ. (.....) |
| 38. පුරාණ ඉන්දියාව අධ්‍යයනය කිරීමේදී භූගෝලීය වශයෙන් කොටස් හතරකට බෙදිය හැක. | සංකීර්ණ භූ ලක්ෂණ හා මානව ලක්ෂ්‍ය නිසා කිසිදු රජෙකුට මුළු ඉන්දියාවම නතු කර ගැනීමට නොහැකිවීම. (.....) |
| 39. මෙගස්තිනිස් නම් ග්‍රීක තනාපතිවරයා ලියූ කෘතිය ඉන්ඩිකාවයි. | ඉන්ඩිකාව පාලියෙන් ලියන ලද මෞර්ය යුගය හැදෑරීමට වටිනා මූලාශ්‍රයකි. (.....) |
| 40. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය 18 වන සියවස අගදී සොයනු ලැබීය. | ප්‍රධාන පාලන නගර 03 ක් හා වරායන් දෙකක් පැවතුන බව හෙළි විය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A S II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

# ඉන්දියා ඉතිහාසය II

කාලය පැය දෙකයි

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | |
|---|---|
| (i) තක්ෂිලා | (v) කාලිංගය |
| (ii) හරප්පා | (vi) සත්පුර කඳු |
| (iii) සුප්පාරක | (vii) මක්‍රාන් |
| (iv) නර්මදා | (viii) දිල්ලිය |

නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි. (ල. 18)

02. ඉන්දීය ඉතිහාසය හැදෑරීමට උපකාරීවන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවල වැදගත්කම පරීක්ෂා කරන්න. (ල. 14)

03. ඉන්දියාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහිලා පහත දැක්වෙන භූගෝලීය සාධක බලපෑ ආකාරය විස්තර කරන්න.
01. හිමාලයා කඳුවැටිය 02. වයඹ දිග දුර්ග මාර්ග (ල. 14)

04. ''හරප්පා' ශිෂ්ඨාචාරය පුරාතන ලෝකයේ ඉතා දියුණු ශිෂ්ඨාචාරවලින් එකකි.''
01. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය බාහිර ලෝකය සමග වෙළඳ සම්බන්ධතා පැවැත් වූ ප්‍රධාන වරාය කුමක්ද? (ල.01)
02. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයට අයත් ප්‍රධාන නගර දෙකක් නම් කරන්න. (ල.02)
03. ඉන්දු නිම්න සභ්‍යත්වය පිළිබඳ කැණීම් කළ පුරාවිද්‍යාඥයින් තිදෙනෙකු නම් කරන්න. (ල.03)
04. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය ලෝකයේ ඉතා දියුණු ශිෂ්ඨාචාරයක් ලෙස සැලකීමට හේතු පරීක්ෂා කරන්න. (ල.09)

05. ඉන්දියානු ආගමික චින්තනයේ වර්ධනය මෙහි දී ඇති මාතෘකාවලට අනුකූලව පැහැදිලි කරන්න.
01. යාඥා හා එහි බලපෑම 02. ජෛන දහම හා බුදුදහම (ල. 14)

06. පශ්චාත් වෛදික යුගයේ දේශපාලන, ආර්ථික හා සාමාජීය තොරතුරු පැහැදිලි කරන්න. (ල. 14)

07. ''ක්‍රි.පූ. 6 වන සියවස ඉන්දීය ඉතිහාසයේ පරිවර්තන යුගයකි.''
01. මහා ජනපද පිළිබඳ තොරතුරු සපයන මූලාශ්‍ර 02 ක් සඳහන් කරන්න. (ල.2)
02. ගණතන්ත්‍ර පාලනය පැවති රාජ්‍යයන් දෙකක් ලියන්න. (ල.4)
03. මේ අවධියේ පැවති ආර්ථික ප්‍රවණතා කෙටියෙන් දක්වන්න. (ල.04)
04. ආගමික ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රවනතාවයන් දක්වමින් මුල් ප්‍රකාශය පැහැදිලි කරන්න. (ල.04)

08. ''ආශෝක අධිරාජයාගේ අරමුණ වූයේ සුභ සාධක රාජ්‍යයක් ගොඩනැගීමයි'' සාකච්ඡා කරන්න.

(ල. 14)

09. පහත දැක්වෙන මාතෘකාවලින් කැමති දෙකක් පිළිබඳව ඓතිහාසික වැදගත්කම දක්වන්න.

(i) ෂඩ් ශාස්තෘවරු සහ ඔවුන්ගේ දර්ශන

(ii) තෙවන ධර්ම සංඝයනාව හා නවරට ධර්මදූත සේවය


(iii) අර්ධද්වීපික ඉන්දියාව

(iv) බිම්බිසාර හා අජාසත්ත මගධයට දැක්වූ දායකත්වය

(එක් කොටසකට ලකුණු 7 බැගිනි)

12 / 13 **ඉන්දියා ඉතිහාසය** - 12 / 13 இந்திய வரலாறு

| විභාග අංකය<br>சுட்டெண் | |
|---|---|




**තෙවන වාර පරීක්ෂණය - ඉන්දියා ඉතිහාසය.**
**පිළිතුරු 12 - ශ්‍රේණිය 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 4 | 21. | 2 | 31. | 4 |
| 2. | 4 | 12. | 4 | 22. | 3 | 32. | 2 |
| 3. | 2 | 13. | 1 | 23. | 1 | 33. | 3 |
| 4. | 2 | 14. | 4 | 24. | 3 | 34. | 5 |
| 5. | 3 | 15. | 5 | 25. | 1 | 35. | 1 |
| 6. | 5 | 16. | 3 | 26. | 4 | 36. | 4 |
| 7. | 4 | 17. | 1 | 27. | 4 | 37. | 5 |
| 8. | 4 | 18. | 5 | 28. | 5 | 38. | 4 |
| 9. | 4 | 19. | 1 | 29. | 4 | 39. | 1 |
| 10. | 3 | 20. | 1 | 30. | 4 | 40. | 3 |

(ලකුණු 40)

**11 පත්‍රය - පිළිතුරු**




01. ඓතිහාසික සටහන් ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. ස්ථාන ලකුණු කිරීමට 08 ඓතිහාසික සටහන් 10 (මුළු ලකුණු 18)

02. * පුරා විද්‍යාත්මක මූලාශ්‍ර ඉන්දීය ඉතිහාසය හැදෑරීමට බෙහෙවින් උපකාරී වීම. (අභිලේඛන, නටඹුන් හා කාසි)

✳ අභිලේඛන - අශෝක රජු වැඩිම සෙල්ලිපි සංඛ්‍යාවක් නිකුත් කර ඇත. ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි හා ලෙන් ලිපි තුළින් අශෝක රජුගේ දිග් විය හා ධර්මය විජය ප්‍රතිපත්ති හඳුනා ගැනීමට හැකිවේ.

✳ අභිලේඛන සමකාලීන වීම මත හා නිරවද්‍ය තොරතුරු රැකගැනීම ඉතිහාසයට වැදගත් වේ.
උදා:- අලහබාද් ප්‍රශස්තිය - සමුද්‍රගුප්ත අවධියට ආලෝකයක් ලබාදේ.
චෝළ සෙල්ලිපි - අර්පාක්කම්, තිරුවාලංගඩු, පල්ලවරායත් පෙට්ටයෙයි, තිරුමලෙයි, විදම්බරම් සෙල්ලිපි චෝළ රජුගේ බල පරාක්‍රමය තහවුරු කෙරේ. II පුලකේශීන්ගේ අයිහෝල් ලිපිය, ඛාරවේල රජුගේ හතිගුම්පා ලිපිය, රුද්‍රදාමන්ගේ ජුනාගාද් අභිලේඛනය වැනි විවිධ වකවානුවල ලියවුන ලිපිවලින් ඉතිහාස තොරතුරු ලබාදේ.

✳ නටඹුන් - ඉන්දු නිම්නය පිළිබඳව මුළුමනින්ම අධ්‍යනය කරන්නේ නටඹුන්වලිනි. මෙහිදී හමු වී ඇති විශාල ගොඩනැගිලි , නිවාස, මුද්‍රා, මංමාවත්, ධාන්‍යාගාරය, නාන තටාකය, හිස් කබල්. තොරතුරු අනාවරණය කරගත හැකිය. ර ජමාළිගා, උද්‍යාන ප්‍රාකාර, වෙහෙර විහාර, දේවාල, කෝවිල්, මේ ගණයට අයත් වේ. අජන්තා, එල්ලෝරා. කාර්ලේ, උයදගිරි, නාසික් ලෙන් විහාර වල කැටයම්, චිත්‍ර මූර්ති, ගෘහ නිර්මාණ ශිල්පීය තොරතුරු තහවුරු කරයි.

✳ කාසි - විනිමය අනුපාතිකයක් ලෙස කාසි හෙවත් නාණක මූලාශ්‍රයකි. කාසි නිකුත් කල තැනැත්තා එහි මාධ්‍ය, සංකේත හා එහි ඇතුළත් පාඨ (ප්‍රකාශන සමකාලීන තොරතුරු ඉතිහාසයට උපකාරී වේ. සමුද්‍රගුප්ත විසින් නිකුත් කළ විවිධ කාසි, දෙවන චන්ද්‍රගුප්ත විසින් නිකුත් කළ විවිධ කාසි, දෙවන චන්ද්‍රගුප්ත, ස්කන්ධ ගුප්ත, කණිෂ්ක චෝළ හා පල්ලව රජුන් නිකුත් කළ කාසි සමකාලීන තොරතුරු තහවුරු කරන මූලාශ්‍රයකි. ආදී ලෙස විස්තර කරන්න. (ල.14)

03.

✳ හිමාලය කඳු වැටිය - හිමාලයා කඳු පෙළ විදේශීක ආක්‍රමණිකයින්ට මහා සාධකයක් වීම. ඊට උතුරින් පිහිටි ටිබෙට් දේහය හරහා හමා එන වියළි එහෙත් දැඩි සුළගින් පවා ඉන්දියාවට ආරක්ෂාව ලැබීම. එමෙන්ම දැඩි සුළගින් පවා

ඉන්දියාවට ආරක්ෂාව ලැබීම. එමෙන්ම උතුරු දෙසින් ආක්‍රමණ හෝ සංක්‍රමණ එල්ල කිරීමට අපහසු වීම. හිමාලයේ විවිධ ශිඛර අතරින් විහිදෙන තැනිතලා බිම් ඔස්සේ වැටී ඇති මාර්ගවලින් කුඩා කණ්ඩායම් වශයෙන් නොයෙකුත්, වෙළඳුන් දේශ සංචාරකයන් හා ධර්ම ප්‍රචාරකයින් ඉන්දියාවත් විදේශ රටවලත්, චීනය, මධ්‍ය ආසියාව දෙසටත්, මොංගෝලියාව වැනි ප්‍රදේශ වලින් ඉන්දියාවටත් ආගිය බව පෙනේ.

- ✳ ඉන්දියාවේ ඉතිහාසය කෙරෙහි ද එහි පිහිටීම හා භූගෝලීය ලක්ෂණ විසින් අත්කළ බලපෑම අසීමිතය. මෙම භූගෝලීය කලාපවලින් උතුරින් ඇති මහා කඳු පෙළ පලමුවෙන්ම හඳුනාගත කලාපවලින් උතුරින් ඇති මහා කදු පෙළ පළමුවෙන්ම හඳුනාගත යුතුය. ඉන්දියාව ආසිය මහද්වීපයෙන් වෙන් කරන හිමාලය කඳු එමර ට ටිබෙට් සානුවෙන්ද වෙන් කරන අතර, දළ වශයෙන් දිගින් 2400 km ක් පළල තැනින් තැන වෙනස් වෙමින් 240 km සිට 320 දක්වා භූමි භාගය පැතිර තිබීම. මෙහි අඩි 2000 කට වඩා වැඩි උස් ශිඛර 114 ක් ඇත. එමෙන්ම වයඹ දෙසින් හින්දුකුෂ්, කාර්කෝරම්, කිර්තාර්, සුලෙයිමාන්, කොහිබබා කදු වැටි වලින් ආරක්ෂාව ලැබී ඇත.

  2. වයඹ දිග දුර්ග මාර්ග - ඉන්දියාවේ වයඹ දිග දේශසීමාවන්ගේ සලකන සුලෙයිමාන්, කිර්තාර්, හින්දුකුෂ් කඳු ආශ්‍රිතව ඛයිබර්, බෝලන්, මක්‍රාන් වැනි කපොලු පිහිටා ඇත. මේ කපොලු ඔස්සේ වූ දුර්ග මාර්ග හරහා සංක්‍රමණිකයන් හා ආක්‍රමනිකයන් ලෙස ඇත අතීතයේ සිටම පැමිණි ජන කොටස් පැරනි ඉන්දියාවේ ඉතිහාසය හැඩ ගැස්වීමෙහිලා විශේෂයෙන් හේතු වී ඇත.

  මක්‍රාන් දුර්ගය - කිර්තාර් කඳු, හා අරාබි මුහුද අතර පිහිටා තිබීම.
  ඛයිබර් දුර්ගය - කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා පිහිටා තිබීම.
  බෝලාන් දුර්ගය - සුලෙයිමාන් කදුවලට බටහිරින් පිහිටා තිබීම.
  බැරෝඩා දුර්ගය - හිමාලය කදු ආශ්‍රිතව පිහිටා තිබීම. ආදිය විස්තර කරන්න. (ල.14)

04. 1. ලෝතල්
2. හරප්පා, මෙහොන්ජොදාරෝ
3. ජෝන් මාර්ෂල්, මෝටිමර් විලර්, ආර්.ඩී.බැනර්ජි, රායි බහාදූර්, දයාරාම්ශානි, කනිංහැම්, ආර්.ඩී. බැනර්ජි, අර්නස්ට් ආර්.ඩී.බැනර්ජි, ජේ.එම්. මැකේ.
4.
- ✳ ලෝකයේ ඉපැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරය අතරින් ඉන්දු නිම්නයට අති විශිෂ්ඨ ස්ථානයක් හිමිවීම.
  දියුනු ශිෂ්ඨාචාරයක පැවතිය යුතු අංග ලක්ෂණ වන නගර, වෙළඳාම, කෘෂි කර්මය, කර්මාන්ත, නිවාස, ඇඳුම් පැළඳුම් ආදිය මෙහි ඉතා දියුණු මට්ටමක තිබූ බවට සාධක හමුවීම.
- ✳ ඉ.නි. ශිෂ්ටාචාරය මුළුමනින්ම නාගරික ලක්ෂණ වලින් යුක්තය.
- ✳ එහි ක්‍රමානුකූල නාගරික සැලසුම්කරණයක් තිබීම.
- ✳ මෙහොන්ජොදාරෝ හා හරප්පා මෙහි විශාල නගර 02 වන අතර අලුතෙන් සොයාගත් කාර්මික නගරය වන්නේ රඛීගාර්හිය.
- ✳ මෙම නගර නිර්මාණයේ හා සමාන බවේ ලක්ෂණ ගැන සැලකිලිමත් වූ පුරාවිද්‍යාඥයින් එහි අගනුවරවල් ලෙස විශ්වාස කරයි.
- ✳ අනෙකුත් අවශේෂ නගරවලද නගර නිර්මාණය දෙස බැලූ විට ඒවා කොටු පවුරකින් වටකල උස් ගොඩනැගිල්ලක ඇතුළු නුවර හා ඊට නැගෙනහිර දෙසින් පිටි නුවරක් ද තිබූ බව දක්නට ලැබීම.
- ✳ දොරටු, කොටු පවුරු මත මුර අට්ටාල තිබීම. කොටු පවුරු අවස්ථා දෙකදී ඉදිකර තිබීම. ඒවා ශක්තිමත් කිරීමට පිළිස්සූ ගඩොල් කයියෝරු තනා තිබීම.
- ✳ නගරයේ අපවිත්‍ර ජලය බැස යාමට විශිෂ්ඨ කාණු පද්ධතියක් සකස් කර තිබීම.
- ✳ නානා හැඩයට කපා පුළුස්සා ගත් ගඩොල් වර්ග ඉන්දු නිම්නය පුරා භාවිතා කර තිබීම.
- ✳ කාණු බැඳීමට අවතල හා උත්තල නැම් වලින් යුත් ගඩොල් භාවිතා වැළැක්වීම.
- ✳ ජිප්සම් නැමැති බදාමයෙන් ඒවා බැද ඇති නිසා ජලය කාන්දු වීම වැළැක්වීම.
- ✳ මංමාවත් ඉතා සැලසුම් සහගත නිර්මාණය කර තිබීම.
- ✳ නගරයට ඇතුළුවන උතුරු දකුණු මහවීදි රෝද යෙදු වාහනවලට මෙන්ම පයින් ගමන් කරන්නන්ට ද ඉඩකඩ ඇති තරම් විශාල වීම් මැද මිදුලක් තිබීම.
- ✳ ශිෂ්ටාචාරය තුළ රෙදි විවීමේ කලාව, කැටයම් හා චිත්‍ර නිර්මාණය කල බව.
- ✳ වෙළඳ කටයුතු දියුණුව පැවැති බව. ක්‍රමානුකූලව කිරුම් මිනුම් ක්‍රම පැවතීම. ආදී වශයෙන් විස්තර කරන්න. (ල.08)

05. 01 යාඥා හා එහි බලපෑම
- ✳ ශ්ලෝක බොහෝමයක් ස්වභාවය ධර්මයේ විවිධ වස්තූන්ට හා අවස්ථාවන්ට දේවත්වය ආරෝපනය කොට තම පූජාවට හා ප්‍රභූන්ට ආරක්ෂාව හා ලෞකික අභිවෘද්ධිය ලබා දෙන ලෙස හඩ නගා ගායනා කිරීම.
- ✳ අග්නි, ඉන්දු වරුන්, මරුත්, ඌෂා, පෘථිවි, අශ්වින් වැනි යාඥවල යෙදීම.
- ✳ වෛදික දෙවිවරුන් අතර අග්නිට වැදගත් තැනක් හිමිවීම.
- ✳ යාගයේ දී පූජකවරුන් හඩ නගා කියන ගද්‍ය සූත්‍ර පාඨ එක් කොට යජුර්වේද පහළ වීම.
- ✳ ඍග් වේදියේ පැවති යාඥය බෙහෙවින් සරල වීම. මුල් කාලයේදී පූජකවරුන් මැදිහත් වීමක් නොවුවද කල්තබාගැනීමේ යාගය වඩාත් සංකීර්ණ විය. මෙහිදී විවිධ අංගවල විශේෂ ඉසිලූ පූජකයෝ ප්‍රමුඛස්ථානයෙන් වූහ. එහිදී සෝම පැළෑටිය අඹරා සෝමපානය සකස් කොට යාතිකා ගායනය කොට ගිනි මොලවන දෙවියන්ට පුද පූජා පැවැත්වීම.
- ✳ රජෙක් තම පාලනය ආරම්භ කලේ රාජසූය නැමැති මහා පරිමාණයේ බිලිපූජා සහිත යාගයකිනි. රජකු අධිරාජ්‍ය තත්වයට පත්වනු සඳහා මුලින් අශ්වයකු වසන්ත කාලය තුළ නිදහසේ හැසිරීමට ඉඩදී ඒ ගමන් කළ ප්‍රදේශයේ අධිපතිකම අධිරාජ්‍යත්ව ප්‍රකාශයට පත් කොට අශ්වයා මහජනයා ඉදිරියේ මරා බිලි පූජා පවත්වා අශ්වමේද යාගය පැවැත්වීම ආදී වශයෙන් විස්තර කරන්න.

**බුදු දහම හා ජෛන දහම**
- ✳ ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතයෙන් බුදුසමයෙන් බාහිරව විවිධ ආගමික දෘෂ්ඨීන් 62 ක් පැවැතිනි. ඒවා අතරින් ප්‍රමුඛස්ථානයට පත් වූ දෘෂ්ටි හයකි.

* ජෛන ශ්‍රමණයෝ තමන් සියලු ගැට බන්ධනවලින් නිදහස් බව ප්‍රකාශ කරනු සඳහා වස්ත්‍ර ඇඳීමෙන් වැලකී සිටියහ. එබැවින් ඔවුන් නිගණ්ඨ නම් විය.

06. දේශපාලනයः-

* ගෝත්‍රික සමාජයේ සිට තරමක් ස්ථාවර විය. ඒ සමඟ නිත්‍ය රාජාත්වයක් බිහිවීම හා එහි බලය වර්ධනය විය.
* පෙරදිග රජවරු ස්මාට් හෙවත් අධිරාජ්‍ය ලෙසත් දකුණේ රජවරුභෝජ් නමිනුත් උතුරේ රජවරු විරාට් නමිනුත්, මධ්‍යම ප්‍රදේශයේ රජවරු රාජ් සෙලත් හැඳින්වීම.
* අශ්වමේද රාජසූය වැනි යාගවලින් රාජ්‍ය බලය තහවුරු කරගත් පාලකයෝ සිටීම.
* සභා සමිති ආයතන තවත් විකාශනය වෙමින් පැවතීම.
* රජුගේ පාලනයට සහාය වීමට පුරෝහිත, සේනාපති, ග්‍රාමනී, භාගධුග සූත, සංග්‍රාහීතා, සලාගල, වර්ණ පිරිස් සිටීම.
* රජුට ගෙවිය යුතු බද්ධ ගවයන්ගෙන් හෝ නිෂ්පාදනවලින් කොටසක් විය.
* එම බද්ධ බෞද්ධ ධර්ම සූත්‍ර අනුව නිෂ්පාදනයෙන් 1/6 ක් විය.

**ආර්ථික**

* මේ අවධියේ කෘෂිකර්මාන්තය ප්‍රධාන කොට ගෙන වෙළඳාමේ විවිධ කර්මාන්තත් ආර්ථික පොහොසත් කරන ලදී.
* තිරිගු, ඉරිගු, යව, බාර්ලි වගා කළ අතර එයට ගැලපෙන භෞතික පරිසර සාධක යෝග්‍ය විය. ගංගා අභ්‍යන්තරයේ වී වගා කළ බවට මූලාශ්‍ර හෙළි කරයි.
* වෙළඳාම ගංගා, ඇලදොළ, ඔස්සේ මෙන්ම ගොඩබිම ඔස්සේ ද පවත්වා ගෙන ගොස් ඇත. භාණ්ඩ හුවමාරු ව මත එදිනෙදා ජීවිතයට අවශ්‍ය බඩු භාණ්ඩ කර්මාන්ත හා වෙළඳාමට යොමු විය.
* පේෂ, කුඹල්, රන්රිදී, ඇඳුම් හා අභරණ, සත්ව පාලනය ආර්ථිකයට ශක්තියක් වීම.

**සාමාජීය**

* පශ්චාත් වෛදික යුගයේදී වර්ණ භේද ක්‍රමය ආරම්භ වීම.
* ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් චතුර්වර්ණයක් දක්නට ලැබීම.
* ක්ෂත්‍රියයන් රාජ්‍ය කරවු අතර, බමුණන් රජුට උපදෙස් දෙමිනි ආගමික කටයුතුවල නිරත විය. වෛශ්‍යන් වෙළඳාම් කටයුතුවල නිරත වූ අතර ශුද්‍රයන් පහත්ම කුලය විය. ඔවුන් බලය මෙහෙකම් කරමින් ජීවත් වූහ.
* හැම කුලයක්ම තමාට ආවේණික සමාජ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් මගින් පාලනය වීම හා හැම කුලයමට සමාජ ස්ථරයේ ඉහළ හෝ පහළ නිශ්චිත තත්වයක් තිබුණි.
* ආශ්‍රමධර්ම, ආපද්ධර්ම ද සමාජ ජීවිතයට සම්බන්ධ විය.

07. (i) බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ , සුත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ සීහනාද හා මහාසුදස්සන සුත්‍ර

(ii) වජ්ජි, මල්ල

(iii)

* බෞද්ධ සාහිත්‍යයේ එන තොරතුරුවලට අනුව සමාජයේ කැපී පෙනන කොටස් දෙකක් වීම.
* එනම් නිදහස් ගොවීන් හා වෙළඳුන්ය.
* ගංගා හිඳි වෛශ්‍යයන්ගෙන් සැදුණු ඉඩම්හිමි ප්‍රබල පන්තියක් ගොඩ නැගීම.
* තොටුපලවල් ආශ්‍රිත වෙළඳ නගර බිහිවීම, නිසා විදේශ හා අභ්‍යන්තර වෙළඳාම මෙකල ජනප්‍රිය වීම.
  උදාः- බරණැස, උජ්ජෙයිනි, වැනි වෙළඳ නගර බිහිවීම, තවලම් හා ගැල් පන්ති මගින් අභ්‍යන්තර වෙළඳාම සිදුවීම.
* ගංගා හා යමුනා තැනිතලාවේ ජලය උපයෝගී කරගෙන විශාල ගොවිබිම් බිහි වීම. රජවරු ප්‍රාදේශීය රාජ්‍යවල ප්‍රධානීන් ඒවා කෘෂි කර්මාන්තයට දායක වූ බව එකල වප් මගුල් උත්සව පැවැත්වීමෙන් පැහැදිලි වේ.
* වෙළඳාමේ දී භාණ්ඩ හුවමාරුවීම, සිදුවුවද කාසි භාවිතයද පැවතීම.
* මෙකල රජුට බදු අයකර ගැනීම සිදුවීම.
* ඉඩම් බදු ලෙස බලි බද්ද හා නිෂ්පාදන ද්‍රව්‍යවලින් ලබාගත් භාග නම් බද්ද හා කර හා ශුල්ක නමින් හැඳින්වූ බදු වර්ග අය කිරීම.
* ඉඩම්වල විශාලත්වය අනුව බදු එකතු කළ අතර ඒවා එකතු කිරීමට නිළධාරීන් පත් කර සිටිම.
* එමෙන්ම විවිධ ශිල්ප දක්ෂතා පදනම් කරගත් කර්මාන්ත වලින් ද එකල ආර්ථික ශක්තිමත් වී තිබීම. ආදී ලෙස විස්තර කරන්න.

(iv)

* යාගහෝම පුද පූජාවලට වඩා ඥාණ මාර්ගය හෙවත් අවබෝධ කර ගැනීම මෙකල ප්‍රචලිත වීම.
* බ්‍රාහ්මණ යාග හෝමවලට විරුද්ධව අභියෝගාත්මක ලෙස විවිධ ආගමික කණ්ඩායම් බිහිවීම. ඔවුන් ශ්‍රමණ නමින් හැඳින්වීම. ඒ අතර ෂඩ් ශාස්තෘවරුන්ගේ දර්ශන වැදගත් වීම. නිගණ්ඨනාථ පුත්ත හෙවත් ජෛන මහා වීර ජෛන ධර්මය ඉදිරිපත් කිරීම.
* භාවනාව හා පන්සිල් රැකීම ප්‍රධාන වගකීම වීම.
* මෙකල බෞද්ධ දර්ශණය ඉදිරිපත් වීම.
* බුදුන් වහන්සේගේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීම.
* මෙකල ආජීවක හා බ්‍රාහ්මක යනුවෙන් ප්‍රධාන නිකාය දෙකක් මතුවීම. තවුස් දම් පිරූ කණ්ඩායම් සිටීම.
* බුදු දහම හැර වෙනත් දෘෂ්ඨීන් හැටදෙකක් එකල තිබූ බව සාහිත්‍ය තොරතුරු මගින් පැහැදිලි වේ.
* මෙකල බ්‍රාහ්මණ ඉගැන්වීම් අභියෝගයට ලක් කිරීම.
* චතුර්වර්ණ සංකල්පය විවේචනයට භාජනය වීම.
  * ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යන වර්ණ 04 වෙනුවට සමානාත්මතාවය සමාජය තුළ මුල් බැස ගැනීම.
  * ඒ නිසා පුද්ගලයින්ට නිදහස් චින්තයට ඉවක් ලැබීම.
  * ස්ත්‍රීන්ට සමාජයේ නිදහස් බවක් ලැබීම.
  * සමාජය තුළ බමුණන් විසින් ගොඩනගා තිබූ වැඩි මත හෙලා දකිමින් සරල බව සමාජය තුළ ඉස්මතු වීම.

08. (i)

- ✳ කාලිංග යුද්ධයෙන් පසු ධාර්මික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- ✳ සෑම විටම මහජන සුභ සාධනය උදෙසා කටයුතු කිරීම.
- ✳ සියලු මිනිසුන් මාගේ දරුවෝය. යන අදහස දැරීම.
- ✳ උස් පහත් භේදයක් නොසලකා නීතිය, දණ්ඩනය සෑම අයෙකු බව එකසේ සාධාරණය විය යුතුබව.
- ✳ අශෝක රජු සිය ප්‍රජාව බෞද්ධ ප්‍රතිපත්ති අනුව හැඩ ගැස්වීම සඳහා අවවාද අනුසාසනා දැක්වීම.
- ✳ රටවැසියාගේ සුඛිත මුදිතභාවය පිළිබඳ නිතරම සිත් යොදවා කටයුතු කළ අශෝක රජු මං මාවත් අලුත්වැඩියා කිරීම, මගින්ගේ පහසුව සඳහා සෙවනට ගස් සිටුවීම. මාර්ග ආසන්නයේ ළිං, පොකුණු තැනවීම, විශ්‍රාම ශාලා කරවීම, ඖෂධ නිපදවීම, සඳහා ඔසු උයන් කරවීම.
- ✳ සේවක සේවිකාවන්ට රජු මැනවින් සංග්‍රහ කිරීම.
- ✳ තම රටවැසියා තුළ ගුණධර්ම වගා කොට සමාජය ද ධාර්මික මාවතකට ගෙන ඒම.
- ✳ තමන් විසින් සකස් කළ ධර්මය අධිරාජ්‍ය තුල පතුරුවා හැරීම සඳහා ධර්ම මාහා මාත්‍රාවරු පත් කිරීම.
- ✳ මිනිසුන්ට වන්දනාමාන කිරීම සඳහා රජු විසින් අසූ හත්දහසක් වෙහෙර විහාර ඉදි කිරීම.
- ✳ සමකාලීන රජවරුන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගනිමින් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා කටයුතු කිරීම.
- ✳ අවිහිංසාව රජ මාලිගාවේ පවා ක්‍රියාත්මක කළ රජතුමා ශිලා ලිපි මගින් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා, ව්‍යාපරයක් ද ගෙන ගියේය.
- ✳ නාට්‍ය, දර්ශන, චිත්‍ර ප්‍රදර්ශන, මගින් දැහැමි සමාජයක් ගොඩ නැංවීමට කටයුතු කිරීම. ආදී වශයෙන් විස්තර කරන්න.

09. 01. ෂඩ් ශාස්තෘවරුන් හා ඔවුන්ගේ දර්ශන

ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දීය ඉතිහාසය පරිවතර්න යුගයකි. එහිදී ආගමික ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන් රැසක් සිදුවිය. නව අදහස් හා චින්තන නරා එළඹීමට ගන්නා උත්සාහයක් හේතුවෙන් ශ්‍රමණ නිකායන් බිහිවිය. එහිදී ෂඩ් දර්ශනය පදනම් කරගත් ශාස්තෘවරුන් 06 ක් කැපී පෙනුණි. ඔවුන් නම්,

01. මක්ඛලී ගෝසාල - දෛවවාදය
02. අජිත කේශකම්බලී - භෞතිකවාදය
03. පූර්ණ කාශ්‍යප - අකිරියාවාදය
04. පකුධ කච්චායනා - ශාස්වතවාදය
05. සංජය බෙල්ලට්ඨිපුත්ත - අමරාමික්ඛේපවාදය
06. නිගණ්ඨනාථපුත්ත - පරම අවිහිංසාවාදය

02. තෙවන ධර්ම සංඝායනාව හා නවරට ධර්ම දූත සේවය

අශෝක රජුගේ ධර්ම විජය ප්‍රතිපත්තියේ එක් සන්ධිස්ථානයක් ලෙස තෙවන ධර්ම සංඝායනාව හැඳින්විය හැක. මෙය ක්‍රි.පූ. 254 දී පවත්වන ලදී. ධර්මාශෝක රජුගෙන් අනුග්‍රහයෙන් පැළලුප් නුවර අශෝක රාමයේ මාස 09 ක් මෙම සංඝායනාව පැවැත්විණි. මොග්ගලිපුත්ත තිස්ස හිමියන්ගේ නායකත්වයෙන් පැවැත් වූ මෙම ධර්ම සංඝායනාවට භික්ෂූන් වහන්සේලා 100 ක් සහාභාගී බවට පරිවර්තනය විය. ධර්මාශෝක රජු භික්ෂූන් වහන්සේලා උපයෝගී කර ගනිමින් නුවරකට ධර්ම දූත සේවය සැපයීය. එම නවරට සසුන් පිහිටු වීම මෙසේය.

01. මහා රාෂ්ට්‍රය - මහා ධම්මරක්ඛිත හිමි
02. අපරන්තය - මහා රක්ඛිත හිමි
03. මහීස මණ්ඩලය - මහාදේව හිමි
04. කාශ්මීර ගාන්ධාර - මජ්ඣන්තික හිමි
05. තම්බපණ්නිය - මහින්ද හිමි
06. හිමවත් ප්‍රදේශය - මජ්ඣිම හිමි
07. යෝනක දේශය - මහා රක්ඛිත හිමි
08. ස්වර්ණ භූමි - සෝණ උත්තර හිමි
09. වනවාසී - රක්ඛිත හිමි

03. අර්ධද්වීපික ඉන්දියාව :-

අර්ධද්වීපික ඉන්දියාව ලෙස සැලකෙන්නේ වින්ධ්‍ය කඳු වැටියෙන් පහළ කොටස වූ දකුණු ඉන්දියාවයි. භූගෝලීය ලක්ෂණ අනුව ක්‍රිෂ්ණතුංග හද නදියෙන් ඉහළ කොටස ඩෙකෑනය ලෙසත්, පහළ කොටස ඈත දක්ඛිණ දේශය ලෙසද හැඳින්වේ. ක්‍රිෂ්ණතුංග හද්‍රා දෙගම්මැදිය දකුණු ඉන්දියාවේ සාරවත්ම භූමිය විය. එය රායිචූර් මිටියාවත, රායිචූර් දෝ ආබය ලෙසද හැඳින්වේ. මේ බිම අල්ලා ගැනීමට ඩෙකැන්යේ හා ඈත දක්ඛිණ දේශයේ බිහිවූ රාජවංශ අතර සටන් පවා ඇතිවයි. ඊට හේතුව එම කාල වකනුවක් තුල රාජවංශ ගණනාවක් බිහිවීමයි. ඩෙකෑනය තුළ සාතවාහන, බේද, රාෂ්ට්‍රකූට, චාලුක්‍ය යන රාජවංශ ද ඈත දක්ඛිණ දේශයේ චෝළ, පල්ලව, පාණ්ඩ්‍ය, විජයනගර් ආදී රාජවංශ දේශපාලන කරලියෙහි වැජඹෙන්නට විය. ඔවුනොවුන් අතර ඇති වූ සටන් අතර මනිමංගලම්, තොප්පම්, වෙල්ලූර්, පනිපන්, කුදල්සංගම් ප්‍රධාන වේ. අර්ධද්වීපික ඉන්දියාවේ නැගෙනහිරින් මහා නදී, ගෝධාවරී, ක්‍රිෂ්ණතුංග කාවේරී යන ගංගා මුහුදට ගලා බසින අතර බටහිරින් නර්මදා හා තප්ති ගංගා මුහුදට ගලා බසී. නැගෙනහිර ඝාට්ස් හා බටහිර ඝට්ස් ද වැදගත් භූගෝලීය ලක්ෂ්‍ය පියා ස්වභාවික වෙරළ තීරණය ද අර්ධද්වීපක ඉන්දියාවට විශාල වටිනාකමක් එක් කළේ ය.

04. බිම්බිසාර හා අජාසත් මගධයට දැක්වූ දාකයත්වය

මගධ රාජ්‍යයේ නැගීමට බිම්බිසාර හා අජාසත්ත රජුගේ දායකත්වය වැදගත් විය. ඔවුන් ඒ සඳහා යුධ ව්‍යාපාර, විවාහ සම්බන්ධතා, මිත්‍ර සම්බන්ධතා උපයෝගී කර ගත්හ. ඊට භූගෝලීය හා ආර්ථික සාධක ද රුකුලක් විය. බිම්බිසාර රජු අංග දේශය ආක්‍රමණය කර එය තමා යටතට ගත්තේය. තවද කෝසල රාජ්‍යයේ කෝසල රජුගේ දියණිය වූද පසේ නදී කොසොල් රජුගේ සොහොයුරිය විවාහ කර ගනිමින් දැවැද්ද ලෙස කාසි රාජ්‍ය ලබා ගත්තේය. ලිච්ඡවී රාජ්‍යයේ මේනක රජුගේ දියණිය වූ චෙල්ලනා කුමරිය ද බිම්බිසාර රජු විවාහ කර ගත්තේය. මද්‍ර රජුගේ දියණිය වූ ඛේමා කුමරිය ද විවාහ කරගත් අතර බිම්බිසාර රජුට බිසෝවරු 500 ක් සිටි බවද සඳහන් වේ. අවන්තියේ චණ්ඩ පජ්ජෝත රජු සමඟ ද මිත්‍ර සබඳතා පවත්වා ඇත.

අජාසත් රජුද මගධයේ නැගීමට යුධ ව්‍යාපාරවලට නිතර විය. ප්‍රථමයෙන් ඔහු කාසි දේශය වෙනුවෙන් කෝසල රාජ්‍යන් සමඟ සටන් කොට අවසානයේ සාමදානව එකඟ වී කෝසලාධිපති පසේ නදී කොසොල් රජුගේ දියණිය වූ වජිරා කුමරියන් සමඟ කාසි දේශය ආපසු ලැබී ඇත. අජාසත් රජු සුනීධ, වත්සකාර, ඇමතියන් දෙදෙනාගේ සහායෙන් වෛශාලින් (විශාලා මහ නුවර) සමඟ සටන් කොට ජය ගත්තේය. (ල. 7 x 2 = 14)